# පිස්කල් විකිණීම්

**තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය**

විකිණීමේ දැන්වීම

*මහනුවර දිසා අධිකරණයේ*
*නඩු අංකය* : DMB 00033/17
*තෙල්දෙණිය දිසා අධිකරණයේ*
*ඇස්කිසි අංකය* : 10/2021

මහනුවර කටුගස්තොට පාර, අංක 187 ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන කලින් ඉන්ද්‍රා ෆිනෑන්ස් සමාගම ලෙසත් නම් වෙනස් කිරීමෙන් පසුව දැනට සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

................*පැමිණිලිකාර සමාගම.*

1. කොඩිතුවක්කු ජානක වජිර කුමාරසිංහ,
2. අංක 151, යටිරාවන, වත්තේගම

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2018ක් වූ ජූලි මස 11 වැනි දින දරන මහනුවර දිසා අධිකරණයේ ඉහත අංක සඳහන් නඩුවේ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් පනස් හය ලක්ෂ අසූ දෙදහස් එකසිය හැට එකයි ශත පනස් හතක (රු. 5,682,161.57) මුදල හා 2017.04.18 දින සිට මෙම තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා 5% බැගින් පොලිය ද ලබා ගැනීම සඳහා ආඥකොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් පනස් හය ලක්ෂ අසූ දෙදහස් එකසිය හැටඑකයි ශත පනස් හතක (රු. 5,682,161.57) මුදල හා 2017.04.18 දින සිට මෙම තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා 5% බැගින් පොලිය ද ලබා ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුවන්ගෙන් කවර ආකාරයෙන් හෝ සියළු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපලෙන් උපදන සහ එකතුවන සියළු කුලී ලාභ සහ අනෙකුත් ආදායම් ද සියළු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ, නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කිසි කළ හැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව විකිණීමේ නියෝගයේ සහ පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

වර්ෂ 2021ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින ප. ව. 2.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරලේ වත්තේගම නගර සභා සීමාව තුළ යටිරාවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යටිරාවන ග්‍රාම නිලධාරී වසමට අයත් යටිරාවන පිහිටි ගලපිටගෙදර වත්ත කියන ඉඩමට වර්ෂ 1984.06.14 වැනි දින අවසරලත් මිනින්දෝරු පී. ආර්. ඩබ්. එම්. වීරකෝන් අවසරලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 1664 දරන පිඹුරේ ලොට් අංක 03 දරන පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) හෙක්ටයාර් 0.0379 වපසරිය ඇති ඉඩමට මායිම්, උතුරු නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් අංක 2 ද, දකුණු නැගෙනහිරට : ආර්. ලින්ටන් යන අය හිමිකම් කියන බලගලමුදූන ඉඩම ද දකුණු බස්නාහිරට : පාර ද, උතුරු බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් අංක 2 ද, තුළ පිහිටි ඉඩමේ ගස කොළ පළතුරු යන ආදී සෑම සියළු දේ ද වේ.

මෙකී දේපල මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක : එල් 68/138 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - තෙල්දෙණිය.

වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 03 වැනි දින දී ය.

09-57

